Library
13926

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |
| කාලය / காலம் / Time: පැය 02 | | |

නම :- ............................................................ විභාග අංකය :- ...........................

## I කොටස

23.11.2016

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) රාගාන්විතවූත්, තාලාත්මකවූත්, ස්වර වලින් පමණක් නිර්මිත ගීත මේ නමින් හැඳින්වේ.
(1) සර්ගම් ගී (2) මධ්‍යලය ගී (3) සරල ගී (4) ලක්ෂණ ගී

(02) ඖඩව ජාතියට අයත්, ශුද්ධ ස්වර වලින් සමන්විත රාගය නම්,
(1) බිලාවල් (2) භූපාලි
(3) කාෆි (4) භූපාලි සහ බිලාවල්

(03) කාෆි රාගයේ ස්වර සංගතියකි
(1) ග ප ම ග ම රි ස (2) ග ප ධ නි ස්
(3) රි ගු රි ම ගු රි ස (4) ප ධ ස රි ග රි

(04) ධි, නා, තු, ධා යන අවනද්ධ අක්ෂර සංයෝගයෙන් නිර්මාණය වී ඇති හින්දුස්ථානි තාලයකි.
(1) ත්‍රී තාලය (2) කෙහෙර්වා තාලය
(3) මැදුම් තනි තිත (4) දාදරා තාලය

(05) මැදුම් තනි තිතට බෙහෙවින් සමීප අපරදිග සහ උතුරු ඉන්දියානු තාල වන්නේ,
(1) $\frac{4}{4}$ සහ දාදරා (2) $\frac{3}{4}$ සහ දාදරා
(3) $\frac{2}{4}$ සහ දාදරා (4) $\frac{3}{4}$ සහ ත්‍රිතාල්

(06) ත්‍රී තාලයේ සිව්වන විභාගය තුළ ඇති ඨේකා කොටස වන්නේ,
(1) ධා තිං තිං තා (2) ධා ධිං ධිං ධා (3) තා ධිං ධිං ධා (4) ධා ධිං තිං තා

(07) මානසික සතුට විනෝදය සහ සමබරව අධ්‍යාපන කටයුතු කරගෙන යාමට සහය ලබාගත හැකි සංගීතමය ක්‍රියාකාරකමකි.
(1) රූපවාහිනිය නැරඹීම (2) පුවත්, සඟරා කියවීම
(3) ගීත තැටි එකතු කිරීම (4) සංගීත භාණ්ඩ වාදනය

(08) සරල ගීතයක් වර්ණවත් කිරීම සඳහා යොදාගනු ලබන කෙටි ස්වර ඛණ්ඩ මේ නමින් හැඳින්වේ.
(1) පෙරවාදන - Introduction (2) සංවාදන - Harmony
(3) අතුරුවාදන - Interlude (4) බිට්ස් - Bits

(09) උදාර වූ හෙළ විරුවන් පිළිබඳ අභිමානයෙන් රචනා වී ඇති සරල ගීතයකි.

(1) රුවන් නිදන හෙළ බිමයි (2) රත්න දීප ජන්ම භූමි
(3) මගේ රටට දළදා හිමි සරණයි (4) තෙදිනි විරාජ

(10) සිතාරය හා එස්රාජයේ දැකිය හැකි පොදු ලක්ෂණයකි.

(1) තත් 7කින් යුක්ත වීම
(2) මිශ්‍රාබයෙන් වාදනය කිරීම
(3) ප්‍රධාන තත මන්ද්‍ර 'ම' ස්වරයට සුසර කිරීම
(4) තුම්බාව දැවයෙන් නිර්මාණය කිරීම

(11) තබ්ලාවක කොටස් තුනකි

(1) දාණ්ඩි, තරප්, තුම්බා (2) ගට්ටා, බද්ධි, චාන්ටි
(3) මිශ්‍රාබ්, කුණ්ඩී, තත් (4) ස්‍යාහි, ලවය, මංකා

(12) මහනුවර රජවාසල 'කවිකාර මඩුව' කේන්ද්‍රකොට බිහිවූ ගායනා කීපයකි.

(1) නූර්ති, නාඩගම්, කෝලම් (2) වන්නම්, ප්‍රශස්ති, නූර්ති
(3) වන්නම්, ප්‍රශස්ති, හටන් ගී (4) නාඩගම්, විරිඳු, රබන්

(13) උකුසා වන්නම සහ නෛඅඩි වන්නම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) වන්නම් දෙකම පහතරට වන්නම් වේ
(2) වන්නම් දෙක සඳහා දවුල වාදනය කරයි
(3) උකුසා වන්නම මහ තනි තිතටද නෛයඩිවන්නම මැදුම් මහ දෙතිතටද ගැයේ
(4) උකුසා වන්නම උඩරට වන්නමකි. නෛයඩිවන්නම පහතරට වන්නමකි

(14) 'තෙදිනි විරාජ රුවිනි විරාජ' ගීතය සඳහා ආභාෂය ලබා ඇති ගායන විශේෂය වන්නේ,

(1) ප්‍රශස්ති ගී (2) වන්නම් (3) නූර්ති ගී (4) නාඩගම් ගී

(15) ප්‍රථම සිංහල නූර්තියෙහි පුරෝගාමියකු ලෙස අප අගය කළ යුතු ලාංකිකයෙකි

(1) ජෝන්ද සිල්වා මහතා (2) චාල්ස් ඩයස් මහතා
(3) සී. දොන්. බස්තියන් මහතා (4) කේ. එම් බලිවාලා මහතා

(16) මද්දලයෙන් වාදනය කළ හැකි තාලයකි

(1) දාදරා (2) කෙහෙර්වා (3) මහතනිතිත (4) තංගපාට

(17) 'ස්වර්ණා...රන් පට සළු ඉඟ ඇඳ...' යන ගීතය ඇතුලත් සිංහල නාඩගමකි.

(1) බැලසන්ත නාඩගම (2) ඇහැලේපොල නාඩගම
(3) ස්වර්ණතිලකා නාඩගම (4) වෙස්සන්තර නාඩගම

(18) මාත්‍රා දෙකේ රිද්ම රටාවකි

(1) × - - | × - - | (2) | × × × | × × × |
(3) × - × | × - × | (4) × - | × × ×

(19) බටහිර සංගීතයේ දී ග්‍රේට් ස්ටාෆ් (Great Staff) එකක රේඛා ගණන කොපමණ ද?

(1) 10 කි (2) 9 කි (3) 5 කි (4) 4 කි

(20) බටහිර සංගීත ප්‍රස්තාරයක ට්‍රෙබල් ක්ලෙෆ් (Treble Clef) සංකේතය නිවැරදිව දැක්වෙන්නේ,

(1) 

(2) 

(3) 

(4) 

(ලකුණු 1 බැගින් 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(01) (1) මෙම ස්වර කොටස් හඳුනා ගනිමින්, ඊට අදාලවන රාගය නම් කරන්න.

A ග, මරි, ගපධනි, සංනිධප, මගරිස

B ගපධසං , රිංසංධප, සංපධප, ගරිස

(2) A රාගයෙහි ආරෝහණ, අවරෝහණ ස්වර ලියන්න.

(3) B රාගයේ සර්ගම් ගීතයේ ස්ථායි කොටස ලියන්න. (ලකුණු 10)

(02) (1) අහස පුරා තාරකා.... මෙම ගී පාදය තාලානුකුලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 02)

(2) එම ප්‍රස්තාරයට ගැලපෙන හින්දුස්ථානි තාලය නම් කර එම තාලය විභාග කරන්න. (ලකුණු 04)

(3) එම ගී පාදයට කාෆි රාගයේ ස්වර යොදා තනුවක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

(03) (1) පහත දැක්වෙන්නේ නූර්ති සහ නාඩගම් රංග ශෛලීන්ගේ සුවිශේෂ ලක්ෂණ කිහිපයකි. එම කරුණු නිවැරදිව තෝරා වගුගත කරන්න.

A පොතේ ගුරු, බහුබූතයා වැනි චරිත

B දෙබස් ගීත ස්වරයෙන් කීම

C හින්දුස්ථානි රාගධාරී තනු

D ශෛලිගත සම්ප්‍රදාය

E සර්පිනාව, වයලීනය භාවිතය

F මද්දල දෙකක් වාදනය කිරීම

| නූර්ති | නාඩගම් |
|---|---|
| | |

(ලකුණු 06)

(2) නූර්ති ගීතයක ස්ථායි කොටසක් ලියන්න. (ලකුණු 04)

(04) (1) පි ත ව ත | දු වු ද ත | සැ ऽ ऽ ऽ | ම ऽ ऽ ऽ | මෙහි සඳස්මත් ගණන හා ගීමත් ගණන ලියන්න. (ලකුණු 02)

(2) ''බුද්ධං සරණේ සිරස දරාගෙන'' මෙම තුන්සරණේ ගී පාදය ගායනය කරන ආකාරය අනුව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(3) සයති පැදි සහ නියති පැදි සඳහා නිදර්ශන ගීත පාද 2ක් ලියන්න. (ලකුණු 04)

(05)




(1) ඉහත තාලය නම් කරන්න. (ලකුණු 01)

(2) 1 - 5 දක්වා අංකනය කර ඇති සලකුණු පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 05)

(3) 1 සහ 2 අංක අනුව කියවෙන සංකේතයන් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)